# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2175/2 - 2020 මැයි මස 12 වැනි අඟහරුවාදා - 2020.05.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 12/1978 (III)

**2020 අභියාචනාධිකරණ (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණ වෙතින් ඉදිරිපත් වන අභියාචන සඳහා වූ කාර්ය පටිපාටිය) රීති**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ අගවිනිසුරුවරයා විසින් සහ ඒ ව්‍යවස්ථාව යටතේ ඔහු විසින් නම් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිසුරුවරුන් විසින් සාදනු ලබන රීති.

1. අගවිනිසුරු ජයන්ත ජයසූරිය
2. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු බී. පී. අලුවිහාරේ
3. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු කේ. එස්. ජේ. ද ආබෲ
4. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ප්‍රියන්ත ජයවර්ධන

2020 මැයි මස 12 වැනි දින,
කොළඹ දී ය.

රීති

1. මේ රීති 2020 අභියාචනාධිකරණ (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණ වෙතින් ඉදිරිපත් වන අභියාචන සඳහා වූ කාර්ය පටිපාටිය) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

1A - G 32235— 27 (2020/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. 1989 මාර්තු මස 13 වන දින අංක 549/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1988 අභියාචනාධිකරණ (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණය වෙතින් වන අභියාචන සඳහා වූ කාර්ය පටිපාටිය) රීතිවල 2 (1) (අ) රීතියේ, 2 (2) රීතියේ, 11 (3) රීතියේ සහ 12 (2) රීතියේ පටහැනිව කුමක් සඳහන් වුවද එය නොතකා -

(අ) 2 (1) (අ) රීතියේ සඳහන් දින දාහතරක කාලසීමාව ගණනය කිරීමේ දී 2020 මාර්තු මස 16 වන දින සිට ආරම්භව 2020 මැයි මස 18 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සැලකිල්ලට ගනු නොලැබිය යුතු ය ;

(ආ) 2 (2) රීතියේ සඳහන් දින විසි අටක කාලසීමාව ගණනය කිරීමේ දී 2020 මාර්තු මස 16 වන දින සිට ආරම්භව 2020 මැයි මස 18 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සැලකිල්ලට ගනු නොලැබිය යුතු ය ;

(ඇ) 11 (3) රීතියේ සඳහන් දින දාහතරක කාලසීමාව ගණනය කිරීමේ දී 2020 මාර්තු මස 16 වන දින සිට ආරම්භව 2020 මැයි මස 18 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සැලකිල්ලට ගනු නොලැබිය යුතු ය ; සහ

(ඈ) 12 (2) රීතියේ සඳහන් දින හැටක කාලසීමාව ගණනය කිරීමේ දී 2020 මාර්තු මස 16 වන දින සිට ආරම්භව 2020 මැයි මස 18 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සැලකිල්ලට ගනු නොලැබිය යුතු ය.

ජයන්ත ජයසූරිය,
අගවිනිසුරු.

බී. පී. අලුවිහාරේ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු.

කේ. එස්. ජේ. ද ආබෲ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු.

ප්‍රියන්ත ජයවර්ධන,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.